ස.සෙ.කො.චක්‍රලේඛ අංක 04 /2019

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමූපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2019.08. ०६

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමූපකාර සමිති,
පළාත් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමූපකාර මහා සංගමය, ස.ණ.ස.සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමූපකාර සමිති හා සංගම් වල
ගරු සභාපති හා සාමාන්‍යාධිකාරී වරුන් වෙත,

## විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම්.

සමූපකාර සමිතිවල විනය පරීක්ෂණ නිළධාරීන්ට හා නීති නියෝජිතයන්ට කරන ගෙවීම් පිළිබඳව වූ ස.සෙ.කො. චක්‍රලේඛ අංක 02 /2000 හා 2000.01.21 දිනැති චක්‍රලේඛය මින් අවලංගු කරනු ලැබේ.

02. ඉහත චක්‍රලේඛයේ සඳහන් දීමනා වර්තමාන තත්ත්වය යටතේ ප්‍රමාණවත් නොමැති හෙයින් පහත සඳහන් සීමාවන්ට යටත්ව ගෙවීම් කල හැකි බැව් වයඹ පලාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ තීරණය පරිදි මෙයින් දැනුම් දෙමි.

| | පරීක්ෂණය පැවැත්වෙන පැයකට දීමනාව. | ලිපිකරු/යතුරු ලේඛක සහාය තැපැල් ගාස්තු වශයෙන් වැය වූ මුදල. | අවසාන වාර්තාව පිළියෙල කිරීම. |
|---|---|---|---|
| 1. පරීක්ෂණ නිළධාරී. | රු. 500.00 | රු. 1,000.00 | රු. 3,000.00 |
| 2. නීති නියෝජිත/පැමිණිල්ල මෙහෙය වන නිලධාරී | රු. 400.00 | - | රු.1,500.00 |

03. සමූපකාර සමිතිය විසින් ලිපිකරු/යතුරු ලේඛක සහායක හා තැපැල් ගාස්තු සපයනු ලබන්නේ නම් ඒ සඳහා වෙන් කර ඇති මුදල ලැබීමට හිමිකමක් නැත.

04. විනය පරීක්ෂණයට අදාලව කාර්ය සටහන් යතුරු ලියනය කිරීමේ දී හෝ පරිගණක ගත කිරීමේ දී හෝ යතුරු ලියන්නෙකුට පැයක කාලයක් සඳහා රු.125/= ක දීමනාවක් ගෙවිය හැකිය.

05. විනය පරීක්ෂණ නිළධාරියෙකු /පැමිණිල්ල මෙහෙය වන නිළධාරියෙකු පරීක්ෂණය සඳහා නියම කර ගත් ස්ථානයට නියමිත දින නියමිත වෙලාවට පැමිණියමුත්, ඔහු වගකිව යුතු වන්නේ නැති විශේෂ කරුණක් පදනම් කර ගෙන මෙම පරීක්ෂණය වෙනත් දිනකට කල් තබන්නේ නම් පැයකට ගෙවනු ලබන දීමනා මුදලින් අඩක් පැය 4 ක කාල සීමාවකට යටත්ව ගෙවිය යුතු වන්නේය.

06. මාස 06 ක කාලයක් ඇතුලත විනය පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව විනය බලධරයා වෙත භාර දෙන්නේ නම් පමණක් ඉහත 2 ඡේදයේ සඳහන් සියලු දීමනා වලට අමතරව රු.2,000.00 ක දීමනාවක් ලබා ගැනීමට විනය පරීක්ෂණ නිළධාරියාට හිමිකම ඇත.

07. යම්කිසි විශේෂ හේතුවක් පදනම් කරගෙන පරීක්ෂණයේ වාර්තාව ලබා දීමට මාස 06 කට වඩා ප්‍රමාද වන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය මත කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය ඒ සඳහා ලබාගෙන ඇති නම් මිස විනය පරීක්ෂණ නිළධාරියාට ඉහත 2 ඡේදයේ සඳහන් දීමනා වලින් පහත සඳහන් ආකාරයට අඩු කර ගෙවිය හැකි වේ.

I. මාස 06 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනා වලින් 5% ක්.
II. මාස 09 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනා වලින් 10% ක්.
III. මාස 12 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කරන්නේ නම් දීමනා වලින් 25% ක්.

08. මෙම චක්‍රලේඛය 2019.09.01 දින සිට ක්‍රියාත්මක වේ.

09. මෙම චක්‍රලේඛය වයඹ පලාත් සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් ගේ එකඟතාවය ඇතිව වයඹ පලාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ නියෝගය පරිදි නිකුත් කරනු ලැබේ.

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

පිටපත්- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පලාත. - කා. දැ.පි.
2. ලේකම්, සමූපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමූපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.

OC
2019.08.06.